විද්‍යාලය : ර/ ඇරැපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 12 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දුර

**නිර්දේශිත ග්‍රන්ථය : නූතන පද්‍ය සංග්‍රහය**

**ප්‍රශ්නය : කොළඹ යුගයේ දෙවන පරපුරට අයත් කවීන්, ළමා අත්දැකීම් කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණයෙහි ලා දක් වූ සමත්කම නූතන පද්‍ය සංග්‍රහයේ එන පද්‍ය පන්ති තුනකින් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.**

**පිළිතුර සඳහා මග පෙන්වීම :**

- **සොබා සිරිය, සමාජ අසාධාරණය, ප්‍රේමය, ගැමි දිවිය, කතා පුවත් කවියට නැගීම කොළඹ යුගයේ දෙවන පරපුරට අයත් කවීන්ගේ නිර්මාණවල වස්තු විෂය විය.**
- **පී.බී. අල්විස් පෙරේරා - පැසුණු පැන**
  **සාගර පලන්සූරිය - ඉගිලෙන සිහින**
  **ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළදරු හැඟුම්**
- **ළමා ලොවේ කෙළිලොල් සිතුම්-පැතුම්, යහපත් සිරිත්-විරිත් හා ඇවතුම්-පැවතුම්, ස්වභාව සෞන්දර්යයේ අපූර්වත්වය උක්ත කාව්‍ය නිර්මාණවල අන්තර්ගත විය.**
- **ළමා කාව්‍ය නිර්මාණවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ භාෂාවේ සරලත්වයයි.**
- **කලාත්මක යනු නව්‍යබවයි. අලුත් ආකාරයෙන් සිතා නව නිර්මාණ බිහිකිරීමයි.**
- **උක්ත අදහස් ඉදිරිපත් වන පරිදි සංවේදී දරු පරපුරක් රටට දායාද කිරීමට කවියා උත්සුක වී ඇති අයුරු තහවුරු කරමින් පිළිතුර ලියන්න.**